**මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024/2025**

----------------------------------------------------------------------------------------------------

සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ 2024 හා 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂවල මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021/2022, 2022/2023, 2023/2024 හා 2024/2025 වර්ෂ සඳහා වන මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2025 සැප්තැම්බර් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දැනට 2020/2021 වර්ෂය විගණනය අවසන් කර ඇති අතර 2021/2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට භාරදීමට සූදානම් කරමින් පවතින අතර හැකි ඉක්මණින් ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනයට භාරදීමට කටයුතු කරමි. | චක්‍රලේඛය පරිදි නියමිත දිනවලදී මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 වත්කම් හා වගකීම්, ආදායම් හා වියදම්වල පැවැත්ම

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019/2020 හා 2020/2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයිතමය | 2019/2020<br>වටිනාකම (රු.) | 2020/2021<br>වටිනාකම (රු.) |
|---|---|---|
| **වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් | 21,480,763 | 18,036,614 |
| ජංගම වත්කම් | 111,072,882 | 119,468,978 |
| **මුළු වත්කම්** | **132,553,645** | **137,505,592** |
| ස්කන්ධය | (28,305,403) | (24,707,845) |
| **වගකීම්** | | |

| | | |
|---|---|---|
| ජංගම නොවන වගකීම් | 17,443,717 | 17,603,728 |
| ජංගම වගකීම් | 143,415,331 | 144,609,709 |
| **ස්කන්ධය හා මුළු වගකීම්** | **132,553,645** | **137,505,592** |
| මුළු ආදායම | 130,125,819 | 147,082,434 |
| මුළු වියදම | 159,303,425 | 143,599,016 |
| **ලාභය / අලාභය** | **(29,177,606)** | **3,483,418** |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශය 2.2.2 (a) (ii) ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට එක් වතාවක් බැගින් වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා සමාගමේ කාර්යසාධනය පිළිබඳව මඟපෙන්වීමක් හා කාර්යඵල ඇගයීමක් සිදු කළ යුතු වුවද 2019 වර්ෂයේ සිට 2025 මාර්තු 31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබීම හේතුවෙන් 2024 - 2025 මාර්තු 31න් අවසන් වර්ෂ සඳහා කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වා නොතිබුණි. | 2019 වර්ෂයේ සිට 2025 ජුලි මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොතිබූ බැවින් රැස්වීම් පවත්වා නොමැත. නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර 2025.07.31 වන දින පළමු රැස්වීම පවත්වන ලද අතර මේ වන විට මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නියමිත පරිදි පවත්වාගෙන යනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ආයතනයේ වැඩිදියුණුව සඳහා රැස්වීම් පවත්වා ඵලදායී තීරණ ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 4.2.1 මාර්ගෝපදේශය | සමාගම විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වුවත් 2022-2025 වර්ෂ සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 හා 2024 වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සභාපතිතුමාගේ අනුමැතියෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළද අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 4.2.2 (ආ) මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කාල සටහනක් සකසා නිසි කළමනාකරණයක්ද සිදුකළ යුතු වුවත් එවැනි ප්‍රසම්පාදන කාල සටහනක් 2022-2025 වර්ෂ වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | 2023 හා 2024 වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමාගේ අනුමැතියෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2025 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළද අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන කාල සටහනක් සකසා නිසි කළමනාකරණයක්ද සිදුකර අපේක්ෂිත අරමුණු ඉටුවන ලෙස ක්‍රියාවට නැංවිය යුතුය. |
| (ඇ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරණ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණගත කිරීම සඳහා විධිමත් පරිදි සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | විධිමත් පරිදි සකස් කළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 ජුලි 16 දිනැති අමප/15/0940/631/018-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව තහවුරු කිරීම් සඳහා සියලු සම්පත්, වත්කම්, කොටස් සහ කළමනාකාරීත්වය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් ලබාගත යුතු බව සඳහන් වුවද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් සමාගමේ කොටස් අයිතියෙන් අත්කරගෙන තිබුණේ සියයට 27ක් පමණක් වන අතර විගණිත දිනය වන 2025 සැප්තැම්බර් 30 දින වන විටත් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට මේ දක්වා පැවරීමේ ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදු කිරීම සම්බන්ධයෙන් බොහෝ ඉල්ලීම් සිදුකර ඇත. නමුත් 2024 වර්ෂයේ අග භාගයේ පත් වූ නව රජය අප සමාගම පාලනය වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙන්ම මහවැලි අධිකාරියද එකම අමාත්‍යාංශයක් යටතේ පාලනය වන හෙයින් දැනට පත්කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලය එම ආයතන අතර පිළිවෙළින් නිළධාරීන් දෙදෙනෙකු සහ තිදෙනෙකු වශයෙන් පත් කර ඇත. සමාගමේ කොටස් පවරාගැනීම ඉදිරියේදී අමාත්‍යාංශය ඉහළ කළමනාකාරීත්වයේ තීරණ මත කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගම ඇවර කිරීම සහ පැවරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කලංකුට්ටිය ගොවිපොළ ඉඩම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 9 ක් සඳහා අධිභාර ඇතුළුව රු.10,485,000 ක බදු මුදල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවා නොමැති බැවින් බදු අයිතිය අවලංගු කරන බවට අංක RPM/T/L/CLO/ගල්/74 හා 2017 ඔක්තෝබර් 10 දිනැති ලිපිය මගින් මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු (එච් කලාපය) විසින් දන්වා තිබුණද 2025 සැප්තැම්බර් 08 දින වන විටත් එම බදු ගෙවා නොතිබුණි. තවද එම බදු දේපළ සඳහා වූ ගිවිසුමද විගණිත දිනය වන 2025 සැප්තැම්බර් 30 දක්වාම විගණනයට ඉදිරිපත් නොවීය. | ඉතා පහළ මූල්‍ය මට්ටමක් පැවතීම හේතුවෙන් අදාළ බදු මුදල් ගෙවීමට නොහැකි විය. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්තුමාගේ මූලිකත්වයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිතුමා, අමාත්‍ය මණ්ඩල නිලධාරීන් සහ මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ කළමණාකාරීත්වයත් අතර පැවති සාකච්ඡාවේදී මහවැලි අධිකාරියට අයත් ගොවිපොළවල් වලට සමාගමෙන් ණය පදනම මත ලබාගත් බ්‍රොයිලර් කුකුළු පැටවුන් සඳහා අයවීමට ඇති රු.12,057,503 ක් බදු මුදල් සඳහා කපා හැර කලංකුට්ටිය ගොවිපොළෙහි අක්කර 25 ක භූමි ප්‍රමාණය සමාගමට පවරා දීමට තීරණයක් ගෙන තිබුණද ක්‍රියාත්මක වීම මන්දගාමී මට්ටමක පවතී. | හිඟ බදු මුදල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවීමටත් ගිවිසුමකට එළඹීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහවැලි අධිකාරියට අයත් අක්කර 26 කින් යුතු සමාගමේ කාර්යාලය පිහිටි ගොවිපොළ ඉඩමට අදාළ තිස් අවුරුදු බදු ගිවිසුමේ කාල සීමාව 2019 වර්ෂයේ ඔක්තෝබර් 02 අවසන් වී තිබුණද ඉඩමට අදාළ ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාගම ගොවිපොළ පවත්වාගෙන යන මහවැලි අධිකාරියට අයත් නිරාවීය අක්කර 02ක භූමි ප්‍රමාණය සම්බන්ධයෙන්ද බදු ගිවිසුමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | බදු කාලය නැවත අලුත් කර ගැනීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමා මගින් බොහෝ ඉල්ලීම් ලිපි මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව "එච්" කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා සමඟ සිදුකළ සාකච්ඡාවේදී අදාළ ලිපිගොණු තඹුත්තේගම මහවැලි "එච්" කලාප කාර්යාලයේ නොමැති බව ප්‍රකාශ කර ඇත. | බදු කාල සීමාව අවසන් වී ඇති ඉඩම් සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීම හෝ ගිවිසුම් යාවත්කාලීන කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | 2012 නොවැම්බර් 29 දින සිට 2013 ඔක්තෝම්බර් 29 දින දක්වා කාල සීමාව තුළ පෞද්ගලික ආයතනයකින් සමාගමේ ගොවිපොළට සපයන ලද වටිනාකම රු. 19,353,842ක් වූ සත්ත්ව ආහාර වෙනුවෙන් ගෙවීම් කිරීමට ලබාදී තිබුණු චෙක්පත් අගරුවීම මත අදාළ සැපයුම් ආයතනය විසින් සමාගමට විරුද්ධව අනුරාධපුර අධිකරණයේ නඩු අංක 30118 M හා අංක 30126 M දරණ නඩු 2 ක් ගොනුකර තිබුණි. 2025 මාර්තු 05 දින අංක 30118 M දරණ නඩුවෙන් සමාගම පරාජයට පත් වී තිබුණු අතර පසුව සමාගම විසින් අනුරාධපුර මහාධිකරණයේ ප්‍රතිශෝධන නඩුවක් ගොනුකර තිබුණි.තවද 30126 M දරණ නඩුවෙන් සමාගම නිදොස් කොට නිදහස් කර තිබුණද අදාළ සැපයුම් ආයතනය විසින් නැවත සමාගමට විරුද්ධව ප්‍රතිශෝධන නඩුවක් ගොනුකර තිබුණි. | චෙක්පත් අගරු වීම සම්බන්ධයෙන් ගොනුකර තිබූ නඩුවලට අදාළව රු.19,353,842 ක හිඟ මුදල ඉදිරියේදී අදාළ සමාගමට ගෙවා නඩුව සමථයකට පත්කිරීම, නීතිඥ ගාස්තු සඳහා අධික මුදලක් මේ වන විට ගෙවා තිබීම නිසා තව දුරටත් නීතිඥයින් වෙනුවෙන් මුදල් ගෙවමින් කාලය හා ධනය නාස්ති කිරීම නිෂ්ඵල බැවින් නඩු සමථකරණයට පත්කරගැනීම සුදුසු බව NLDB සභාපතිතුමා ඇතුළු අලුතින් පත් කළ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කරන ලදී. අධ්‍යක්ෂක මණ්ඩල උපදෙස් පරිදි පෞද්ගලික ආයතනය සමඟ සිදුකළ සාකච්ඡාවේදී ගෙවීමට ඇති හිඟ මුදල සමඟ පෞද්ගලික ආයතනය විසින් වැයකළ රු.3,000,000ක් වූ නීතිඥ ගාස්තු සමඟ රු.22,353,842 ක් මාසිකව රු.2,500,000 බැගින් ගෙවීමටත් එහි පලමු වාරිකය වන ලක්ෂ 25 ක් 2025 සැප්තැම්බර් 26 දින චෙක්පතකින් ගෙවීමටත් ඉදිරි වාරික | ගොවිපොළ සපයන ලද සත්ත්ව ආහාර ඇතුළු ද්‍රව්‍ය වෙනුවෙන් ඒවායේ නිවැරදිතාවය තහවුරු කරගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙම නඩු කටයුතු සඳහා 2018 ජනවාරි 05 දින සිට 2025 ජූලි 09 දක්වා රු.1,244,680 ක නීති වියදම් සමාගම විසින් වැය කර තිබුණි. කෙසේ වුවද 2025 ඔක්තෝබර් 31 දින වන විට සමාගම විසින් අදාල සැපයුම් ආයතනය සමඟ සාකච්ඡා කර ගෙවීමට ඇති මුදල් වාරික වශයෙන් ගෙවීම සඳහා දෙපාර්ශවය විසින් එකඟතාවයකට පැමිණ තිබුණි. | 08 ක් පිළිවෙලින් 2025 ඔක්තෝබර් මාසයේ සිට 2026 අප්‍රේල් මස දක්වා ලක්ෂ 25 බැගින් ගෙවා 2026 මැයි මස අවසන් වාරිකය වන රු.2,353,842 ක් ගෙවීමටත් එකඟ වී තිබුණි. දෙපාර්ශවය විසින් මේ වන විට මෙම නඩු සමථකරණයට සාකච්ඡා කර ඇති බැවින් එහි පලමු වාරිකය වන රු 2,500,000 චෙක්පතකින් 2025 සැප්තැම්බර් 26 වන දින ගෙවන ලදී. | |
| (ඉ) | සමාගමේ ලෙජර් ගිණුම් අනුව අංක 70168, 80168, 10168 හා 40/2023 අංක දරණ නඩු කටයුතු සඳහා 2023 නොවැම්බර් 11 සිට 2025 සැප්තැම්බර් 25 දක්වා කාල සීමාව තුළ නීතිඥ ගාස්තු ඇතුලු අනෙකුත් වියදම් සඳහා රු.2,786,330 ක වියදම් දරා තිබුණි. මෙම නඩු පැවරීම සඳහා හේතුවූ කරුණු, අදාළ නඩු තීන්දු හා ගෙවීමට සිදුවූ වන්දි මුදල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | සමාගමේ ජෛව ආරක්ෂණ ක්‍රියාවලියට අනුගතව ඉදිකරන ලද පිවිසුම් මාර්ගය බාහිර පාර්ශවයක් විසින් පොදු භාවිතය සඳහා යොදාගැනීම පිලිබද ආරවුලක් ඇතිවීම සම්බන්ධයෙන් පොලිසිය වෙත සිදුකළ පැමිණිල්ලට අදාළව කැකිරාව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අංක 80168 නඩුවට ලබා දුන් තීන්දුව අනුව මෙම මාර්ගය පොදු මාර්ගයක් බවට තීන්දුව ලබා දෙන ලදී. මෙම ගොවිපොළ අභිජනන ගොවිපොළක් බැවින් මෙම මාර්ගය පොදුවේ භාවිත කළ නොහැකි බැවින් නැවත 80168 නඩුවේ නියෝගයට එරෙහිව අනුරාධපුර මහාධිකරණය වෙත අංක 40/2024 දරණ ප්‍රතිශෝධන නඩුව පවරන ලදී. එහිදී ප්‍රතිශෝධනය ප්‍රතික්ෂේප කරමින් මෙම මාර්ගය පොදු මාර්ගයක් බවට තීන්දුව ලබා දෙන ලදී. මෙහිදී වන්දි මුදල් ගෙවීමට සිදු නොවුණි. නීතිඥ ගාස්තු සහ ප්‍රතිශෝධන ගාස්තු ගෙවන ලදී. | සමාගමේ නීති වියදම් අවම කරගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ 2024 වර්ෂයේ නිෂ්පාදන සැලැස්මට අනුව කුකුළු පැටවුන් නිෂ්පාදනය, කුකුළු මස් නිෂ්පාදනය, ඌරන් නිෂ්පාදනය හා පොල් ගෙඩි නිෂ්පාදනය යන කාර්යයන් 04හි ඉලක්කයන් ළඟාකර ගැනීමේදී කුකුළු මස් නිෂ්පාදනය සියයට 38 ක් වැනි අවම මට්ටමක පැවතුණි. කුකුළු පැටවුන් නිෂ්පාදනයේ පමණක් අපේක්ෂිත ඉලක්කය ළඟාකරගෙන තිබුණු අතර පොල්ගෙඩි නිෂ්පාදනය හා හා ඌරන් නිෂ්පාදනය ලඟා කර ගැනීම පිළිවෙලින් සියයට 85 හා සියයට 90ක් වී තිබුණි. | අප සමාගමේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ දිනක් වයසැති කුකුළු පැටව් අලෙවියයි 2024 වර්ෂයේ දී වෙළඳපළ තුළ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවකුගේ මිල ඉහළ අගයක් ගෙන තිබූ බැවින් බ්‍රොයිලර් මස් පිණිස ඇති කරනවාට වඩා පැටව් විකිණීම සමාගමට ලාභදායී තත්වයකි. එසේම එම වර්ෂයේදී අප අලෙවිය සිදු කරන මෙම කලාපය තුළද බ්‍රොයිලර් මස් ඉල්ලුමද පහළ ගොස් තිබූණි. එබැවින් අපේක්ෂිත මස් නිෂ්පාදනය අප සමාගමින් සිදු නොවුණි. | සමාගමේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මූල්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා අඛණ්ඩව අයිරා ශේෂයක් පවතින අතර 2025 මාර්තු 31 දිනට එය රු.19,026,259 ක ශේෂයක් වී තිබුණි. තවද අදාළ කාලසීමාව තුල බැංකු අයිරා පොළී වියදම ලෙස එකතුව රු.4,930,610 ක් ගෙවා තිබුණි. | අප සමාගමට අවශ්‍ය මුදල් රජයේ මහා භාණ්ඩාගාරයෙන් හෝ වෙනත් මාර්ගයකින් නොලැබෙන අතර අප සමාගමට අවශ්‍ය සියළු මුදල් අවශ්‍යතා සමාගමෙන්ම උපයා ගන්නා අතර ආදායම් අඩුවී මුදල් අවශ්‍ය වූ විට අප එම මුදල් අවශ්‍යතා සපුරාගනු ලබන්නේ බැංකු අයිරා පහසුකම මගිනි. එම මුදල් අපගේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ස්ථාවර ගිණුම ඇපයට තබා බැංකු අයිරාව ලබාගනු ලබයි. | බැංකු අයිරා අඩුකර පොළී වියදම අවම කර යහපත් මූල්‍ය තත්වයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාගම විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම දීර්ඝ කාලයක සිට ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතා කර නොතිබූ අතර 2024 මාර්තු 31 දිනට රු.49,389 ක ශේෂයක් පැවතුණි. | අප සමාගමේ ප්‍රධාන ශාඛාව 2015 වසර දක්වා දෙමටගොඩ පිහිටා තිබූ අතර එකල අප සමාගම නමින් දෙමටගොඩ මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක් තිබූ අතර මෙම ගිණුම සම්බන්ධයෙන් අදාළ තොරතුරු ඉල්ලා ලිපියක් එම බැංකුව වෙත යොමු කරන ලදී. එම බැංකුව වෙතින් මේ වන තෙක් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් ලබා දී නොමැත. | නිසි අනුමැතියක් යටතේ බැංකු ගිණුම ක්‍රියාකරි තත්ත්වයට පත්කිරීමට හෝ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය නොවන්නේ නම් මුදල් ලබාගෙන ගිණුම වසා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාගමේ ලෙජර් ගිණුම් අනුව 2025 මාර්තු 31 දිනට මාස 3 ඉක්මවූ ණයගැති වටිනාකම රු.2,372,539ක් වූ අතර එම ණයගැති ශේෂය පිළිබඳව විධිමත් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් දීර්ඝ කාලීන ණයගැති වටිනාකම් නිශ්චිතව හඳුනාගත නොහැකි විය. | සමාගම වසර ගණනාවක සිට පැවත එන ණයගැති ශේෂයන් පැවතියද ඒ පිළිබඳ අප ආයතනය සතුව ප්‍රමාණවත් තොරතුරු නොමැත. එබැවින් එම ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එම තීරණ අනුව කටයුතු කරමි. වර්තමානයේ ණයට විකුණුම් සිදු නොකෙරේ. | ණයගැති ශේෂය පිළිබඳව විධිමත් කාල විශ්ලේෂණයක් සිදුකර ශේෂ අයකරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 වාහන පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් වෑන් රථ, කැබ් රථ, ලොරි රථ, ට්‍රැක්ටර් ඇතුළුව වාහන 9ක් භාවිතා කරන අතර 2024 හා 2025 වර්ෂයන් සඳහා එම වාහන වලට අදාළව දරණ ලද අලුත්වැඩියා වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | වාහන නඩත්තු ලේඛනයක් වර්තමානයේ නඩත්තු කරමින් පවතී. | වාහන අළුත්වැඩියා වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2024 හා 2025 වර්ෂ වල දී සමාගමේ සේවයේ නියුතු තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙළින් 64 ක් හා 69 ක් විය. සමාගමට අවශ්‍ය කාර්යමණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවාගෙන නොතිබුණි. | අප විසින් දක්වා ඇත්තේ අනුමත සේවක සංඛ්‍යාව ලෙස ස්ථිර සේවයේ නියුතු නිළධාරීන් 23 ක් ලෙසයි. නමුත් සේවකයින් 41 ,46 ලෙස ඇත්තේ ගොවිපොළ කම්කරුවන්ය. | සමාගමට අවශ්‍ය කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද ආයතන පාලනය සඳහා වූ මාර්ගෝපදේශයේ 4.2 (h) වගන්තිය ප්‍රකාරව සෑම මාස 3 කට වරක් විගණන කමිටුවක් පැවැත්විය යුතු බවත්, එහිදී ගනු ලබන නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට යැවිය යුතු බවත් සඳහන් වුවද මණ්ඩලය විසින් 2024 හා 2025 වර්ෂවලට අදාළව එම කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. | යහපාලනය සඳහාවූ මඟපෙන්වීම් අත්පොතේ 4.2 (h) වගන්තිය ප්‍රකාරව සෑම මාස 3 කට වරක් විගණන හා කළමනාකරණ කමිටුවක් පැවැත්විය යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ පිටපත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කළ යුතු නමුත් 2022 වර්ෂයේ සිට 2025 දක්වා එම වර්ෂයන් ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්ම සහ 2024 | 2025 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය හා උපායමාර්ගික සැලැස්ම සකස් කර තිබුණද අධ්‍යක්ෂ මණ්ඩලක් නොසිටි හෙයින් එය අනුමත කර ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැසුම් හා ක්‍රියාකාරී සැලසුම් ගිණුම් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. |

හා 2025 වර්ෂ වෙනුවෙන් පිළියෙල කළ ක්‍රියාකාරී සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වර්ෂය වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, සමාගම විසින් ඊට ගැලපෙන පරිදි විධිමත්ව පිළියෙල කරන ලද අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණි. | මේ සඳහා ඉදිරියේදී වැඩපිළිවලක් සකස් කරමින් පවතී. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගත යුතුය. |

## 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කර තිබුණු මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 5ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සමාගම විසින් 2019, 2020, 2021,2022,2023 හා 2024 වර්ෂවල වාර්ෂික වාර්තා 2025 සැප්තැම්බර් 30 දින වන විටත් සභාගත කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි පාර්ලිමේන්තුවට සභාගත කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |